**මන්මුනේ ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්මුනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිගනිමි |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | හිඟ මුද්දර ගාස්තු රු.2,283,441ක් ගණනය කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශනවල එම හිඟ ප්‍රමාණය දක්වා නොතිබුණි. | අයකළ යුතු හිඟ මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයකළ යුතු කඩකුලි රු.52,119 කින් අඩුකර අවසන් ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි. | අයකළ යුතු කඩකුලි නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | අස්ථානගත වූ, නැතිවූ පොත් 1610ක වටිනාකම තක්සේරු කර අවසන් ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | අස්ථානගත වූ, නැතිවූ පොත් 1610 ක වටිනාකම තක්සේරු කර අවසන් ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

### 1.3.3 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් නඩු සඳහා රු.73,000ක් වැය කර තිබුණි. නමුත්, මෙම නඩු තවදුරටත් විභාග වෙමින් පවතින නමුත් මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | නඩු සම්බන්ධ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | නඩු දෙක සඳහා නීතිඥ ගාස්තු අප වෙත කලින්ම දැනුම් නොදීම හේතුවෙන් අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. |

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදුලි ණයගැතියෝ රු.781,370 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට පවතින අතර හිඟ හිටි වටිනාකම් අයකර ගැනීමට හෝ ලෙජර් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට හෝ නැතහොත් පොත්වලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිගනිමි |

#### (ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ණයහිමියෝ රු. 1,861,828 ක් සහ විදුලිය බෙදාහැරීම් ණය වෙනුවෙන් රු. 1,958,630 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට හෝ පොත්වලින් කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෙවීමට හෝ නැතහොත් පොත්වලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිගනිමි |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 88,913,757 ක් වූ ගිණුම් විෂයන් 06 කට අදාලව ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන හා අයිතිය තහවුරු කිරීමේ ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | පිළිගනිමි |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නිතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නිතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) හා (2) වගන්ති හා පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන රජයේ ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභා ක්‍රියාකාරකම් පහසු කිරීමේ අරමුණින් අංග සම්පූර්ණ තීරණ හා උපදෙස් ලබාගැනීම සඳහා සභාවේ මූල්‍ය, ප්‍රතිපත්ති සැලසුම් කිරීම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂණික සේවා, පාරිසරික සහ පොදු පහසුකම් වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර උපදෙස් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම කමිටු ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවේ සෑම ක්‍රියාවක් වෙනුවෙන්ම වෙන වෙනම කමිටු ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිගනිමි |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.982,263 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,041,101 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2019 ඇස්තමේන්තු ගත ආදායම් | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,900,000 | 1,900,000 | 2,634,760 | - | 1,500,000 | 1,957,592 | 1,957,592 | - |
| කුලී | 1,700,000 | 1,981,100 | 1,572,000 | 409,099 | 5,041,700 | 5,236,400 | 4,798,100 | 438,300 |
| බලපත්‍ර ගාස්තු | 1,000,000 | 1,000,000 | 1,196,025 | - | 1,125,000 | 1,651,150 | 1,654,900 | - |
| අනෙකුත් ආදායම් | 47,509,927 | 49,545,876 | 49,174,843 | 1,806,120 | 15,176,000 | 17,521,280 | 18,985,007 | - |
| **එකතුව** | **52,109,927** | **54,426,976** | **54,577,628** | **2,215,219** | **22,842,700** | **26,366,422** | **27,395,599** | **438,300** |

### 2.2.2 වරිපනම් බදු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2010 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා තාවකාලික වරිපනම් බදු පමණක් අයකර තිබිණි. | වර්ෂ 5කට වරක්වත් රජයේ තක්සේරු දෙපාර්තමේන්තු විසින් නැවත ප්‍රත්‍යාගණනයක් වරිපනම් බදු අයකල යුතු වේ. | පිළිගනිමි |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ 11ක පවතින දේපළ මත පසුගිය වර්ෂ 05 ක කාලයක් සඳහා හිඟ වරිපනම් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ වරිපනම් විධිමත්ව ගණනය කිරීම් සිදුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

### 2.2.3 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට හිඟ කඩ කුලී රු.461,218ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී ආදායම් අයකිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගර පුනරුද කඩකාමර සංකීර්ණයේ පිහිටි කඩකාමර 05ම ප්‍රසිද්ධ මිල ගණන් කැඳවා සභාව විසින් ලබාදී නොතිබුණි. | ප්‍රසිද්ධ මිල ගණන් කැඳවා කඩකාමර බදු දීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | බදු ගිවිසුමේ 6වැනි කොන්දේසිය සහ1987 අංක අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) උපවගන්තිය අනුව, සභාව විසින් බදුකරුගෙන් ඇප ලබා නොගැනීම. | බදුකරුගෙන් ඇප ලේඛනයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

**2.2.4 උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු රු. 28,551,114 ක් ලැබිය යුතුව තිබුණි. | 2019 වර්ෂ අවසානය දක්වා උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිගනිමි |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා**<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා 08 ක් 2012 වර්ෂයේදීත්, අතුරු ව්‍යවස්ථා 06 ක් 2013 වර්ෂයේදීත් සහ තවත් අතුරු ව්‍යවස්ථා 04 ක් 2017 වර්ෂයේදීත් සකස් කර අතුරු ව්‍යවස්ථා පිළිබඳ යෝජනා නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. එසේ වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සභාවේ අතුරු ව්‍යවස්ථා සඳහ නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුයි. | පිළිගනිමි |

(ඇ) **අත්හැර දැමූ කාර්යභාරයන්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මස් කඩ 02 ක් සහ සිල්ලර කඩ 02 ක් ඉදිකිරීම සඳහා මුළු ඇස්තමේන්තුව රු. 709,686 කට ගිවිසුම් ගත වී තිබුණි. එසේ වුවත්, සභාව විසින් ඒවා ඉදිකිරීම් සම්බන්ධ කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව විසින් එම කඩ කාමර ඉදිකිරීම සඳහා පියවර ගත යුතු වේ. | පිළිගනිමි |

(ඇ) **තිරසාර සංවර්ධන අරමුණු**

| | | |
|---|---|---|
| 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. | පිළිගනිමි |

## 3.2 වත්කම් කළමනාකරණය

### 3.2.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරිම සඳහා කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරිම සඳහා කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |

### 3.2.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ 08කට මෝටර්රථ ප්‍රවාහන පනත ප්‍රකාරව, ලියාපදිංචි කිරීමේ පොත් ලබාගෙන නොතිබුණි. | වාහන ධාවනය රාජ්‍ය පරිපාලන කළමනාකරණ අමාත්‍යාංශයේ අංක EST-6/TPORT/05/3515 දරන 2016.12.209 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයට අනුකූලව පරීක්ෂාවන් සිදු කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාහන 08ක් සඳහා වාහන ගමනාගමන ආදායම් බලපත්‍ර (Revenue License) ලබාගෙන නොතිබුණි. | වාහන ධාවනය රාජ්‍ය පරිපාලන කළමනාකරණ අමාත්‍යාංශයේ අංක EST-6/TPORT/05/3515 දරන 2016.12.209 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයට අනුකූලව පරීක්ෂාවන් සිදු කළ යුතුවේ. | පිළිගනිමි |

**3.3 ප්‍රසම්පාදනය**

-------------------

**3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------------------ |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් නිවැරදි කරගනු ලැබේ. |

**4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------------

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

-----------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------ |
| සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් නිවැරදි කරගනු ලැබේ. |